මෙම කරුණු the-catamaran.org වියපතියේ © කොටසකි
ජනමාධ්‍යවේදයට කෙටි මං : මූලික හා අන්තර්ජාල වාර්තාකරණයේ මූලිකාංග

# 8 ෂළිඹගූඛ ෂෘඛචිජෘන

## 8.1 ෂළිඹගූඛ ෂෘඛචිජෘනඛ් යණු ඛූඹඛ් ධ?

සම්මුඛ සාකච්ඡාවකින් පත්‍රකලාවේදියෙක් සහ කිසියම් මාතෘකාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙක් දරන මතයන් හා ප්‍රවීණතාව පාඨකයන් සඳහා වැදගත් වන සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තා අතර සිදු වන හමුවක් නැවත ප්‍රතිනිෂ්පාදනය කරයි.
සම්මුඛ සාකච්ඡාවක් අතරතුර දී එම පුද්ගලයාගේ ජීවිතය පිළිබඳ තොරතුරු, ඔහුගේ හෝ ඇගේ මතයන් හෝ ඔහුගේ හෝ ඇගේ ප්‍රවීණතාවන් අනාවරණය වේ. පත්‍රකලාවේදියා හෝ සම්මුඛ පරීක්ෂක ප්‍රශ්න අසමින් පාඨකයා වෙනුවෙන් ක්‍රියාකරයි. පත්‍රකලාවේදියාගේ පුද්ගලික මතයන් සම්මුඛ සාකච්ඡාවක් අතරතුර දී අදාළ නොවේ.

## 8.2 ඛූඹණ උෘඛෘසෘනල ෂළිඹගූඛ ෂෘඛචිජෘ තීපහණ්තණ් ධ?

කිසියම් මාතෘකාවක් හෝ සිදුවීමක් පිළිබඳව: එම මාතෘකාව හෝ සිදුවීම පිළිබඳව තොරතුරු ලබා දෙන ලෙසට ප්‍රවීණයින්ගෙන් හෝ දැනුම් තේරුම් ඇති පුද්ගලයින්ගෙන් අසන විට.
මතයන් හා විශ්ලේෂණ සඳහා: ඇතැම් මාතෘකා හෝ සිදුවීම් පිළිබඳව ප්‍රවීණයින් හෝ දැනුම් තේරුම් ඇති පුද්ගලයින් සිය මතයන් හෝ විශ්ලේෂණ ලබා දෙන විට. මෙම මත හා විශ්ලේෂණ සම්මුඛ පරීක්ෂකගේ විචාරාත්මක සමීක්ෂණයට භාජනය විය හැකිය.
වඩාත් පුද්ගලික පදනමකින්: කිසියම් පුද්ගලයින් කවුරුන් වන්නේ ද යන්න හේතුවෙන් උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් සම්මුඛ පරීක්ෂක ප්‍රශ්න කරන විට, එය ප්‍රවර්තන කටයුතුවලට, ඔවුන්ගේ ප්‍රවීණතා ක්ෂේත්‍රවලට, ඔවුන්ගේ නිපුණතාවලට සම්බන්ධ වන විට හෝ වෙනත් කරුණු සඳහා.
ප්‍රායෝගිකව සැලකීමේ දී විවිධ සම්මුඛ සාකච්ඡා ආකෘති අතර සීමාවන් බොහෝවිට නොපැහැදිලි වේ.

## 8.3 ෂළිඹගූඛ ෂෘඛචිජෘනඛඨ ෂළිඹහණ්ධ නණ ඵ්‍රශ්ණනල න්ර්ග තඹෘණනෘ ධ?

දීර්ඝ පිළිතුරු මතු කරන ප්‍රශ්න. සරල "ඔව්" හෝ "නැහැ" පිළිතුරක් දිය හැකි ප්‍රශ්න ඇසීමෙන් වළකින්න.
ප්‍රේක්ෂකයින් විසින්ම ඇසීමට අවශ්‍ය විය හැකි ප්‍රශ්න. සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තා පුරාජේරු කීමට හෝ දොඩවීමට මඟපාදන ප්‍රශ්න ඇසීමෙන් වළකින්න. සම්මුඛ පරීක්ෂක සහ සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තා අතර පරතරයක් පවත්වන ප්‍රශ්න. අදාළ තැනැත්තා ප්‍රශංසා කරන හෝ ඇසීමෙන් සතුටට පත්වන ප්‍රශ්න ඇසීමෙන් වළකින්න. විචාරාත්මකව සිටින්න.

## 8.3 ෂළිඹගූඛ ෂෘඛචිජෘනඛ් තගෘඨණගණ්තණ් තඛතෂ් ධ?

සම්මුඛ සාකච්ඡාවක් එයට භාජනය වන තැනැත්තාට පාඨකයාව හඳුන්වා දෙන සහ සාකච්ඡා කරන ඕනෑම ප්‍රධාන මාතෘකාවක් සම්බන්ධයෙන් යාවත්කාල කරන කෙටි පැහැදිලි කිරීමේ ඡේදයකින් හඳුන්වා දිය හැකිය.
සම්මුඛ සාකච්ඡාවකට හඳුන්වාදීමේ ඡේදවල ලියා ඇති පැහැදිලි මාතෘකාවක් තිබිය යුතුය.
සම්මුඛ සාකච්ඡාවක් ඕනෑම අදහස් කුළුගන්වන හෝ උනන්දුව ජනිත කරවන ප්‍රශ්නයකින් ආරම්භ කළ හැකිය. සම්මුඛ සාකච්ඡාවක් මුල සිට අග දක්වාම පාඨකයාගේ උනන්දුව රඳවා ගනී.
සම්මුඛ සාකච්ඡාවක් ඕනෑම සංවාදයක් මෙන් වේ. ප්‍රශ්න සහ පිළිතුරු අර්ථාන්විතව එකිනෙකට අදාළ වේ. සම්මුඛ පරීක්ෂක හුදෙක් ප්‍රශ්න ලැයිස්තුවක් ඇසීමට වඩා ඔහුට හෝ ඇයට ඇසෙන පිළිතුරු සම්බන්ධයෙන් සිතිය යුතුය. අනපේක්ෂිත හෝ සිත්ගන්නා පිළිතුරු වෙනත් ප්‍රශ්නවලට මඟපෑදිය හැකි අතර සම්මුඛ පරීක්ෂක එම ප්‍රශ්න ඇසීමට ද සූදානම්ව සිටිය යුතුය.
ප්‍රශ්න ජේළි තුනකට හෝ හතරකට වඩා දීර්ඝ නොවිය යුතු අතර පිළිතුරු ජේළි 10 සිට 15කට වඩා දීර්ඝ නොවිය යුතුය.

## 8.3 ෂළිඹගූඛ ෂෘඛචිජෘනඛ් ඵනත්නණ්තණ්/ ලීයණ්තණ් තඛතෂ් ධ?

පවත්වනු ලබන සම්මුඛ සාකච්ඡා වර්ග කුමක් ද මත භාවිතා කරන භාෂාව සාමාන්‍ය හා කථා කරන භාෂාවේ සිට වෘත්තීමය හා ප්‍රවීණයින් පමණක් අවබෝධ කර ගන්නා භාෂාව දක්වා වෙනස් විය හැකිය.
ප්‍රවීණයින් භාවිතා කරන විෂයානුරූප භාෂාව සම්මුඛ පරීක්ෂක විසින් අවබෝධ කර ගත්ත ද සාමාන්‍ය පුද්ගලයින් සඳහා මෙම භාෂාව " පරිවර්තනය" කිරීමට අවශ්‍ය වේ. පාරිභාෂික පද, විෂයානුරූප භාෂාව සහ කෙටි යෙදුම් පැහැදිලි කළ යුතුය.
සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන පුද්ගලයෙක් කථා කරන ආකාරයේ ඇති අනන්‍ය වාගාලංකාර හෝ ආවේණික ගුණාංග ගතිලක්ෂණ රඳවා ගැනීමට උත්සාහ කරන්න.

This project is funded by the European Union

8

## වීඩ්ෂූඩ්ශා ලැඩීෂ්තුන

1. සම්මුඛ සාකච්ඡාවකින් පොදු මාතෘකාව සුදුසු පරිදි ආවරණය කරන්නේ ද? නැතහොත් කිසියම් වෙනත් ප්‍රවාත්ති ආකෘතියක් - උදාහරණ ලෙස සම්මුඛ සාකච්ඡාව ඇතුලත් වන පැතිකඩක් හෝ විශේෂාංගයක් භාවිතා කිරීම වඩාත් සුදුසු වන්නේ ද? පැතිකඩක හෝ විශේෂාංගයක වැඩි තොරතුරු හා වැඩි පත්‍රකලාරූපී අධීක්ෂණ එකතු කිරීමට හැකිය.

2. මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන්නේ ඇයි සහ සම්මුඛ සාකච්ඡාවට භාජනය වන්නේ කවරෙක් ද යන්න පාඨකයාට අවබෝධ වන්නේ ද?

3. සම්මුඛ සාකච්ඡාව සිදුවෙමින් පවතින විට අසනු ලබන ප්‍රශ්න පිටුපස ඇති පසුබිම හා අභිප්‍රාය පිළිබඳව පාඨකයාට ප්‍රමාණවත් තරම් දැනුවත් කරන්නේ ද? පිළිතුරු සම්බන්ධයෙන් සිදු වන්නේ කුමක් ද?

4. පාඨකයාට කිසියම් පාරිභාෂික භාෂාවක්, විෂයානුරූප භාෂාවක් හෝ ප්‍රවීණයින්ගේ මත අවබෝධ කර ගත හැකි වන්නේ ද?

5. අවසන් කළ සම්මුඛ සාකච්ඡාවෙන් කිසියම් අනවශ්‍ය තොරතුරු, වාග ්බාහුල්‍යය හා පොදු, වැදගත් තොරතුරු නොදෙන ප්‍රලාප ඉවත් කර තිබෙන්නේ ද?

6. සියලුම අදාළ වැදගත් ප්‍රශ්නවලට පිළිතුරු දී තිබෙන්නේ ද? පිළිතුරු ප්‍රශ්නවලට අනුරූප වන්නේ ද? අර්ථාන්විත වන්නේ ද?

7. කවුරු විසින් කවදා සම්මුඛ සාකච්ඡාවට බලය පැවරුවේ ද යන්න පැහැදිලි ද?